# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.12.12 | මාධ්‍ය නිවේදන අංක 2025/139/R

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු.5,000/- ක (රුපියල් පන්දහසක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලූ පොලිස් කොස්තාපල්වරයෙකු සහ පොලිස් සැරයන්වරයෙකු අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

අත්තනකඩවල ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරු විසින් ඔහුට අයත් යතුරු පැදියෙන් 2025.12.09 වන දින ගමන් කරමින් සිටිය දී ඔහුගේ යතුරු පැදිය නවතා පරීක්ෂා කර, වලංගු රියැදුරු බලපත්‍රයක් හා ආදායම් බලපත්‍රයක් නොමැතිව, බීමත්ව ධාවනය කිරීම සම්බන්ධයෙන් නීති මගින් කටයුතු නොකර, පැමිණිලිකරුගේ යතුරු පැදියේ රක්ෂණ සහතිකය සහ කල් ඉවත් වූ ආදායම් බලපත්‍රය සැකකාර පොලිස් නිලධාරීන් භාරයට ගෙන, එම බලපත්‍ර දෙක ආපසු ලබාදීම සඳහා රු. 5,000/- ක (රුපියල් පන්දහසක) මුදලක් අල්ලස් ලෙස ඉල්ලූ, දියබෙදුම පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ සේවය කරනු ලබන පොලිස් කොස්තාපල්වරයෙකු සහ පොලිස් සැරයන්යරයෙකු 2025.12.11 වන දින පෙ.ව.11.30 ට පමණ දියබෙදුම සති පොල ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672